මාධ්‍ය හමුව **ආරම්භ** කරමින්

ඉන්දීය මහ **කොමසාරිස්** සන්තෝ**ෂ්** ජා මැතිතුමා විසින් පළ කළ අදහස්

**(2026** ජනවාරි **08)**

අද දින අප හා එක් වූ ඔබ සැමට ස්තුතියි. පළමුව ඔබ සැමට සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරනවා.

සාමාන්‍යයෙන් සිදු කරන පරිදි ඔබ සියලු දෙනා හමු වී ගෙවී ගිය වසර පිළිබඳව කෙටි ආවර්ජනයක් සිදු කිරීමත් උදා වූ නව වසරේ ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරිත්වය පිළිබඳව අදහස් දැක්වීමත් සුදුසු යැයි අප කල්පනා කළා.

2025 වසර ඉන්දියා - ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික න්‍යාය පත්‍රය යළි බලගැන්වූ, අපගේ ශිෂ්ටාචාරමය මිත්‍රත්වය යළි සහතික වූ වසරක් ලෙස මා කෙටියෙන් හඳුන්වන්න කැමතියි. විශ්වාසය, සුහදත්වය සහ මිත්‍රත්වය අන් කවරදාටත් වඩා ඉහළ මට්ටමක පවතිනවා.

2025 අප්‍රේල් මාසයේ අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය සමඟින් අප වසර ආරම්භ කළා. ශ්‍රී ලංකා ජනාධිපතිතුමා 2024 සැප්තැම්බර් මාසයේ ජනාධිපති ධූරයට පත් වීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවට පැමිණි පළමු විදේශ රාජ්‍ය නායකයා හෝ විදෙස් රජයක ප්‍රධානියා අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා යි. ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපතිධූරයට පත් වීමෙන් අනතුරුව සිය ප්‍රථම විදෙස් නිල සංචාරය සඳහා 2024 දෙසැම්බර් මාසයේදී ඉන්දියාව තෝරා ගත්තා.

මෙම සංචාරය අතරතුරේදී අවබෝධතා ගිවිසුම් රැසක් හුවමාරු කර ගත් අතර නව ව්‍යාපෘති රැසක් නිවේදනය කෙරුණා. සංචාරය අතරතුර සිදු වූ තවත් වැදගත් සිදුවීමක් වන්නේ ශ්‍රී ලංකාව විසින් විදෙස් නායකයකුට පිරිනමන ඉහළම සම්මානය වන 'ශ්‍රී ලංකා මිත්‍ර විභූෂණ' සම්මානය ඉන්දීය අග්‍රාමාත්‍යතුමාට පිරිනැමීමයි. අග්‍රාමාත්‍යතුමා වෙනුවෙන් පැවති භෝජන සංග්‍රහය අතරතුරේදී

අග්‍රාමාත්‍යතුමා සැබවින්ම ඉන්දියා-ශ්‍රී ලංකා සබඳතාවයේ සාරය ගෙන හැර දක්වමින් රටවල් දෙක 'ශිෂ්ටාචාරමය නිවුන් සහෝදරයන්' වන බව සඳහන් කළා.

ඉන් අනතුරුව වසර තුළදී ඉහළ මට්ටමේ හුවමාරු රැසක් සිදු වුණා. අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිනියගේ 2025 ඔක්තෝබර් ඉන්දීය සංචාරය, විවිධ අමාත්‍යවරුන් සිය විෂයන්ට අදාළව ඉන්දියාවේ සංචාරය කිරිම සහ ශ්‍රී ලංකා ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගම් දූත පිරිසේ ඉන්දීය සංචාරය ඇතුළු පාර්ලිමේන්තු දූත පිරිස් විසින් සිදු කළ ඉන්දීය සංචාර මේ අතරට ඇතුළත් වෙනවා.

දෙරට අතර සබඳතාවල ශක්තිය මෙම ඉහළ මට්ටමේ අන්තර්ක්‍රියා තුළින් පමණක් නොව අපගේ නායකත්වයන් විසින් එකඟ වී ඇති න්‍යාය පත්‍රයන් ක්‍රියාවට නැංවීම තුළින් ද පෙන්නුම් කෙරුණා. කෘෂිකර්මාන්තය සහ සෞඛ්‍ය පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම්වල පළමු රැස්වීම් 2025 වසරේදී පැවැත්වුණා. පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම ද දෙවෙන වතාවට මෙම වසරේදී රැස්වුණා. මැතිවරණ නිලධාරීන්, අධිකරණ ක්ෂේත්‍රයේ නිලධාරීන්, විගණන නිලධාරීන්, විවිධ කර්මාන්ත නියෝජනය කරන ශිල්පීන්, රාජ්‍ය අංශයේ නිලධාරීන් ආදී ක්ෂේත්‍ර රැසක ශ්‍රී ලාංකික වෘත්තිකයන් සිය ගණනක් ඉන්දියාවේ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ අතර ඒ තුළින් ධාරිතා ගොඩනැගීමේ ක්ෂේත්‍රයේ අපගේ සහයෝගීතාවය පුළුල් කෙරුණා.

ඉන්දියා-ශ්‍රී ලංකා සංචාරයන් පිළිබඳව සැලකීමේදී වසර අවසන් වූයේ විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා දෙසැම්බර් 22-23 දිනවල සිදු කළ ශ්‍රී ලංකා සංචාරයත් සමඟයි. එතුමා ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාට පණිවිඩයක් රැගෙන අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ විශේෂ නියෝජිතයකු ලෙස ශ්‍රී ලංකාවට පැමිණියා. එතුමා රැගෙන ආ පණිවිඩය වූයේ දිට්වා සුළි කුණාටුවෙන් සිදු වූ විනාශයෙන් අනතුරුව ඉන්දියාව ශ්‍රී ලංකාව සමඟ සහයෝගයෙන් රැඳී සිටිමින් සහය ලබා දෙන බවයි. ඉන්දියාව ශ්‍රී ලංකාවේ වඩාත්ම විශ්වාසදායි මිතුරා සහ රඳා පැවතිය හැකි සහකරුවා වන බව එයින් අවධාරණය කෙරුණා.

ශ්‍රී ලංකාවේ සමීපතම අසල්වැසියා ලෙස ඉන්දියාව සෑම විටම ශ්‍රී ලංකාවට ප්‍රථමයෙන් ප්‍රතිචාර දක්වන රටක් වී තිබෙනවා. දිට්වා සුළි කුණාටුව පැමිණි පළමු දිනයේම අප සාගර බන්ධු මෙහෙයුම යටතේ අපගේ මුදවා ගැනීමේ සහ සහන කටයුතු ආරම්භ කළා.

ජාත්‍යන්තර යුධ නෞකා දැක්ම සඳහා කොළඹ නැංගුරම් ලා තිබූ ඉන්දීය නාවික හමුදාවේ ගුවන් යානා ප්‍රවාහන නෞකාවක් වන INS වික්‍රාන්ත් නෞකාව සහ ඉන්දීය නාවික හමුදාවේ INS උදයගිරි නෞකාව වහාම මානුෂීය ආධාර සහ ආපදා සහන මෙහෙයුම් සඳහා යොමු කෙරුණා. මෙම නෞකා කඩිනමින් වියළි සහ නැවුම් සලාක සහ මානුෂීය ආධාර සහ ආපදා සහන කට්ටල ලබා දුන්නා. INS වික්‍රාන්ත් නෞකාවේ චේතක් හෙලිකොප්ටර් යානා 2ක් සහන කටයුතු සඳහා සහය වීමට පිටත් කෙරුණා.

ඉන් අනතුරුව ඉන්දීය ගුවන් හමුදාවේ Mi-17 හෙලිකොප්ටර් යානා තුනක් ළඟා විය නොහැකි ප්‍රදේශවල සිර වී සිටි පුද්ගලයන් බේරා ගනිමින් සහ ආධාර බෙදා දමමින් සති දෙකකට අධික කාලයක් සක්‍රියව ශ්‍රී ලංකාවේ සහන කටයුතු සඳහා දායකත්වය ලබා දුන්නා. මේ හා සමඟම සාමාජිකයන් 80 දෙනෙකුගෙන් සමන්විත ජාතික ආපදා ප්‍රතිචාර බලකායේ කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණ මුදවා ගැනීමේ සහ සහන මෙහෙයුම් සිදු කළා. ඉන්දීය යුධ හමුදාව වෛද්‍ය කාර්ය මණ්ඩලයේ 85 දෙනෙකුගෙන් සමන්විත ක්ෂේත්‍ර රෝහලක් මහනුවර අසල ස්ථාපනය කළ අතර ඒ හරහා රෝගීන් 8000කට පමණ හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා දුන්නා. BHISHM හදිසි වෛද්‍ය ප්‍රතිකාර ඒකක දෙකක් ද ශ්‍රී ලංකාවට ගුවනින් රැගෙන ආ අතර ඒවා සුළි කුණාටුවෙන් වැඩිම බලපෑමකට ලක් වූ දිස්ත්‍රික්කවල ස්ථාපනය කෙරුණා.

සිදු වූ මහත් විනාශයේ තරම සහ ස්වභාවය හේතුවෙන් අත්‍යවශ්‍ය සම්බන්ධතා යටිතල පහසුකම් කඩිනමින් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අවශ්‍යතාවය පැන නැඟුණා. මෙම කරුණ අතිගරු ජනාධිපති දිසානායක මැතිතුමා සහ අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා අතර 2025 දෙසැම්බර් 01 වන දින පැවති දුරකථන සංවාදය අතරතුරේදී ද සාකච්ඡා කෙරුණා.

ඒ අනුව, බේලි පාලම් ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට ගුවනින් රැගෙන ආවා. විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමා සහ විදේශ අමාත්‍ය ගරු විජිත හේරත් මැතිතුමා දිට්වා සුළි කුණාටුවෙන් විනාශ වූ A35 මහා මාර්ගයේ කිලිනොච්චි හි ඉන්දිය යුධ හමුදාවේ ඉංජිනේරු බලකාය විසින් ඉදිකරන ලද පළමු බේලි පාලම විවෘත කළා. මහනුවර-රාගල මාර්ගය අසල තවත් පාලම් දෙකක ඉදිකිරීම් කටයුතු අවසන් වීමට ආසන්නයි. මෙම පාලම් ඉන්දිය යුධ හමුදාවේ ඉංජිනේරුවන් 45 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් ස්ථාපනය කෙරෙනවා. ඉන්දිය යුධ හමුදාවේ සංඥා විශේෂඥයන් (පැරා ක්ෂේත්‍ර රෝහල් කණ්ඩායමේ කොටසක්) විසින් මහියංගන ප්‍රදේශයේ හානියට පත් OFC කේබලයක් යළි සම්බන්ධ කරමින් ප්‍රදේශයේ සම්බන්ධතාවය යළි යථා තත්ත්වයට පත් කළා.

සමස්තයක් වශයෙන් සාගර් බන්ධු මෙහෙයුම යටතේ ඉන්දියාව විසින් නොවැම්බර් 28 වන දින සිට දෙසැම්බර් 22 වන දින දක්වා වියළි සලාක, කූඩාරම්, ටාපෝලින්, සනිපාරක්ෂක කට්ටල, අත්‍යවශ්‍ය ඇඳුම් සහ ජල පිරිපහදුකරණ කට්ටල ඇතුළු ටොන් 1100කට අධික සහනාධාර, ටොන් 14.5ක පමණ ඖෂධ සහ වෛද්‍ය උපකරණ, ටොන් 60ක උපකරණ සහ ටොන් 228ක බේලි පාලම් කොටස් ලබා දී තිබෙනවා.මෙයට අමතරව ශ්‍රී ලංකාවේ තිබෙන ඉන්දිය සමාගම් ශ්‍රී ලංකාවේ ප්‍රතිසාධනය සහ දිගු කාලීන සංවර්ධනය සඳහා සිය කැපවීම අවධාරණය කරමින් Rebuilding Sri Lanka අරමුදල සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 1කට අධික පරිත්‍යාග සිදු කර තිබෙනවා.

විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් 2025 දෙසැම්බර් අග භාගයේ සිදු කළ සංචාරයත් සමඟ දැන් අප අපගේ අවධානය ශ්‍රී ලංකා රජය විසින් නිවේදනය කර ඇති ප්‍රයත්නයන් සහ පැකේජ සඳහා සහය ලබා දීම උදෙසා නැවත ඉදිකිරීම සහ යළි ගොඩනැගීම වෙත යොමු කර තිබෙනවා.

මෙතුළින් පෙන්නුම් කෙරෙන්නේ ඉන්දියාවේ අසල්වැසියා ප්‍රථමයෙන් සහ මහාසාගර් ප්‍රතිපත්තීන් තුළ ශ්‍රී ලංකාවට හිමි වන වැදගත් ස්ථානයයි. ඉන්දියාව ඇමරිකානු ඩොලර් මිලියන 450ක පැකේජයක් සමඟින් ශ්‍රී ලංකාවේ සහය සඳහා පෙරට පැමිණීම තුළින් පිළිබිඹු වන්නේ මෙම

ප්‍රතිපත්තියයි. මෙම පැකේජය ශ්‍රී ලංකා රජයේ විවිධ අමාත්‍යාංශ විසින් හඳුනාගෙන ඇති අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දක්වනවා.

යෝජිත ආධාර පැකේජයට ඇමරිකානු ඩොලර් මිලියන 350ක සහනදායි ණය ආධාර සහ ඇමරිකානු ඩොලර් මිලියන 100ක ප්‍රදාන ඇතුළත් වෙනවා. සුළි කුණාටුවෙන් වැඩිම බලපෑමකට ලක්වූ අංශ යළි නඟා සිටුවීම සඳහා ශ්‍රී ලංකාවට සහය වෙමින් මේ යටතේ විවිධ ක්ෂේත්‍ර සඳහා ආධාර ලබා දෙනු ඇති.

සහය ලබා දෙන පුළුල් කාණ්ඩ පහ වන්නේ:

(i) මාර්ග, දුම්රිය මාර්ග සහ පාලම් සම්බන්ධතා පුනරුත්ථාපනය සහ ප්‍රතිෂ්ඨාපනය කිරීම;

(ii) සම්පූර්ණයෙන් විනාශ වූ හා අර්ධ ලෙස හානි වූ නිවාස ඉදි කිරීම සඳහා සහය;

(iii) විශේෂයෙන්ම සුළි කුණාටුව හේතුවෙන් හානියට පත් සෞඛ්‍ය සහ අධ්‍යාපන පද්ධතීන්ට සහය;

(iv) කෙටි සහ මධ්‍ය කාලීනව ඇති විය හැකි හිඟයන් සපුරා ගැනීම සඳහා සහයෝගය ඇතුළුව කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා සහය සහ

(v) වඩා හොඳ ආපදා ප්‍රතිචාර සහ සූදානම සඳහා කටයුතු කිරීම.

විදේශ කටයුතු අමාත්‍යතුමා සිය සංචාරය අතරතුරදී ශ්‍රී ලංකා නායකත්වය සමඟ සිදු කළ සාකච්ඡාවන්ගේ අවධානය යොමු වූයේ විවිධ ක්ෂේත්‍ර සඳහා මෙම ආධාර කෙතරම් කඩිනමින් ක්‍රියාවට නැංවිය හැකිද යන්න පිළිබඳවයි. විවිධ අමාත්‍යාංශවල නිලධාරීන්ගෙන් සමන්විත ඒකාබද්ධ අධීක්ෂණ සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් මේ සඳහා ස්ථාපනය කර තිබෙනවා. 2025 දෙසැම්බර් අවසාන සතියේදී මා සහ කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත මහතා මෙහි පළමු හමුවේ මූලසුන හෙබවූවා.

එළඹෙන සතියේදී, මෙම පැකේජය යටතේ ඉදිකරන ලද පාලම් දෙකක් විවෘත කිරීමට අප බලාපොරොත්තු වෙනවා. අප උතුරු දුම්රිය මාර්ගයේ ප්‍රතිෂ්ඨාපන කටයුතු ද අරඹනවා. ඇමරිකානු ඩොලර් මිලියන 30කට ආසන්න ප්‍රදානයන් යටතේ පාලම් ඉදි කිරීමට යෝජිතයි. අපගේ

ඇස්තමේන්තු අනුව දිට්වා සුළි කුණාටුවනේ හානියට පත් සියලු පාලම් ප්රතිෂ්ඨාපනය කිරීම සඳහා මයෙ ප්රමාණවත් වනු ඇති. උතුරු දුම්රිය මාර්ගය අලුත්වැඩියා කිරීම ද මමෙ ප්රදානය යටතේ සිදු කරෙනු ඇති.

ඉදිරි සති කිහිපය සඳහා වන වැඩපිළිවළෙට රජය විසින් හඳුනාගනෙ ඇති ප්රදේශවල RO ජල පිරිපහදුකරණ කට්ටල 200කට ආසන්න සංඛ්යාවක් ස්ථාපනය කිරීම ඇතුළත් වනෙවා. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් නිවාස අහිමි වූ අය සඳහා තාවකාලික නවාතැන් ඉදි කිරීම සඳහා අමුද්රව්ය ලබා දීම තවත් ප්රමුඛතාවයක්. ඇමරිකානු ඩොලර් මිලියන 50ක ප්රදානයක් හරහා අර්ධ වශයනේ හානි වූ සහ සම්පූර්ණයනේ විනාශ වූ නිවාස අලුත්වැඩියා කිරීම සඳහා යෝජනා සම්බන්ධයනේ කරුණු කාරණා අවසන් කිරීමට ද අප කටයුතු කරමින් සිටිනවා. එසේම අප ඉන්දිය රුපියල්වලින් නම් කරන ලද ණය පහසුකම්වල කොන්දේසි ඇතුළු විවිධ ව්යාපෘතීන්වල කරුණු කාරණා අවසන් කිරීමට ද අපේක්ෂා කරනවා. ණය පහසුකම් මගින් හානි වූ මාර්ග සහ දුම්රිය මාර්ග යළි ගොඩනැගීමට අවකාශ සලසනු ඇති අතර ආහාර, ඖෂධ, වෛද්ය උපකරණ, පොහොර, පශු සම්පත් සහ හිඟයක් පවතින අදාළ වනෙත් ද්රව්ය සම්පාදනය කර ගැනීම සඳහා සහය ලබා දනෙු ඇති

ඔබ දන්නා පරිදි, පශ්චාත් ආපද ප්රතිසාධන අදියරේදී කාලය තීරණාත්මකම කාරණාවයි. අපගේ සැලසුම් ප්රගතිය සඳහා වන ඉලක්ක සමඟින් ඉතා සැලසුම්සහගතව සකස් කොට තිබනෙ අතර නිරන්තරයනේ නියමිත කාල පරාසයන් හිදි සමාලෝචනය කරෙනෙවා. මේ පිළිබඳ නව තොරතුරු අපි ඔබ සමඟ බදො ගන්නම්. වඩාත් ඉක්මනින් මමෙ කටයුතු ක්රියාත්මක කිරීම සඳහා ඔබ විසින් දපොර්ශ්වයම දිරි ගන්වනු ඇතැයි අප අපේක්ෂා කරනවා.

මිත්රවරුනි, මමෙ ආධාර පැකේජය සහ එය කඩිනමින් ක්රියාත්මක කිරීම සඳහා අපගේ උනන්දුව තුළින් පිළිබිඹු වන්නේ ඉන්දියා-ශ්රී ලංකා හවුල්කාරිත්වයේ ජනතා කේන්ද්රීය ස්වභාවයයි. මමෙ පැකේජය ලබා දනේනේ අද දක්වා ඉන්දියාව විසින් ශ්රී ලංකාවට ලබා දී ඇති ඇමරිකානු ඩොලර් බිලියන 7ක සමස්ත ආර්ථික ආධාරයන්ට අමතරවයි. ඇමරිකානු ඩොලර් මිලියන 780කට අධික

වටිනාකමකින් යුත් ව්‍යාපෘතීන් සමඟින් ඉන්දියාව තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංවර්ධන සහකරු වෙනවා. මෙම ව්‍යාපෘතීන් වලින් බොහෝමයක් ප්‍රදාන යටතේ දැනට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ සිව්වන අදියර යටතේ වතුකර ප්‍රදේශවල නිවාස 10000ක් ඉදිකිරීමත් ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘතීන් අතරට අයත්. මේ අතරින් නිවාස 3300ක් ඉදිකිරීමේ විවිධ අදියරවල පවතින අතර නිවාස 6700ක් තුලින් සුළි කුණාටුවෙන් පීඩාවට පත් හෝ අනාගතයේදී ආපදවකට ලක් වීමේ අවදානමක් සහිත පවුල්වලට ප්‍රතිලාභ සැලසිය හැකියි. එසේම, ඉන්දිය සම්භවයක් සහිත දෙමළ ප්‍රජාවගේ ජීවිත නඟා සිටුවීම සඳහා ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 10ක පැකේජයක් ලබා දෙනවා. මෙයින් ඇමරිකානු ඩොලර් මිලියන 8ක් පමණ තවමත් භාවිතා කර නොමැති අතර එය ද රජය විසින් ක්‍රියාත්මක කර ඇති පශ්චාත් ආපද ප්‍රතිසාධන ප්‍රයත්නයන්ට සහය වීම සඳහා, විශේෂයෙන්ම ඇතැම් විට දිට්වා සුළි කුණාටුවෙන් වැඩිම බලපෑමකට ලක් වූ ප්‍රජාව විය හැකි ඉන්දිය සම්භවයක් සහිත දෙමළ ප්‍රජාව සඳහා යොදා ගත හැකියි.

මෙලෙස මේ සම්බන්ධයෙන් වන විශේෂ සහයෝගයට අමතරව ඉන්දියාව දෙරට අතර වෙළෙඳාම සහ ආයෝජන ක්ෂේත්‍රයේ ආර්ථික සබඳතා වඩාත් ගැඹුරු කිරීම සඳහා ද ශ්‍රී ලංකාව සමඟ අඛණ්ඩව තවදුරටත් කටයුතු කරනු ඇති. ආපද තත්ත්වය හමුවේ වුවද NASSCOM දූත පිරිස ශ්‍රී ලංකාවට සහයෝගය දක්වමින් 2025 දෙසැම්බර් 4-6 දිනවල ශ්‍රී ලංකාවට පැමිණියා. ඉන්දියාවේ ප්‍රමුඛ පෙළේ තොරතුරු තාක්ෂණ සමාගම්වල ප්‍රධාන නිලධාරීන් 20කට වැඩි පිරිසකගෙන් සමන්විත කණ්ඩායමක් විසින් සිදු කළ මෙම සංචාරය ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික පරිසරය පිළිබඳ විශ්වාසය පළ කළ සංචාරයක් පමණක් නොව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංචාරක කාලසීමාවන් වන දෙසැම්බර් සහ ජනවාරි මාසවල ඔබගේ මේ සුන්දර දිවයිනට පැමිණීමට ඉන්දීය සංචාරකයන්ට දිරිගැන්වීමක් ද වුණා.

2025 වසර අපගේ ආර්ථික හවුල්කාරිත්වයේ සන්ධිස්ථාන රැසක් සනිටුහන් කළ වසරක් ද වෙනවා. සාම්පූර් සූර්ය විදුලි බලාගාරය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම සහ මහව-අනුරාධපුරය දුම්රිය මාර්ගයේ සංඥා පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා කටයුතු සමාරම්භ කිරීම ඇතුළු සුවිශේෂී

ව්‍යාපෘතීන් රැසක් ඇරඹුණා. මහව-ඕමන්තේ දුම්රිය මාර්ගය නවීකරණය කිරීම සහ ආගමික ස්ථාන 5,000ක් සඳහා වහල මත සවිකරන සූර්ය විදුලිබල පද්ධතීන් ලබා දීම වැනි වැදගත් ව්‍යාපෘතීන් ද සම්පූර්ණ කෙරුණා. ශ්‍රී ලංකාවේ විදුලිබලය ඉන්දියාවට අපනයන කිරීම සඳහා සැලකිය යුතු විභවතාවයක් පවතින විදුලිබල ජාල අන්තර් සම්බන්ධතාවය සම්බන්ධයෙන් ද සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනුණා. මේ හා සමඟම, තාක්ෂණය, නවෝත්පාදනය සහ කෘත්‍රිම බුද්ධිය යන නව ක්ෂේත්‍ර වෙත ද දෙරට අතර නියැළීම් ව්‍යාප්ත කෙරුණා. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාරම්භක සමාගම් ඉන්දියාවේ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සඳහා සහභාගි වූ අතර ඉන්දියාවේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාර ප්‍රාග්ධන සමාගම් ශ්‍රී ලංකාවේ නවෝත්පාදන පාරිසරික පද්ධතිය සඳහා සහයෝගය ලබා දෙන බවට ප්‍රකාශ කළා.

අප පාරදෘශ්‍ය සහ කාර්යක්ෂම රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතීන් ගොඩනැගීම සඳහා ද ශ්‍රී ලංකා රජයට සහය වෙනවා. සංචාරක ක්ෂේත්‍රයේ සබඳතා තවදුරටත් ශක්තිමත් වී තිබෙන අතර 2018 වසරේ වාර්තා වූ ඉහළම අගය ඉක්මවා යමින් 2025 වසරේ සංචාරක පැමිණීම්වලින් 20%කට වැඩි ප්‍රමාණයකට දායකත්වය ලබා දුන්නේ ඉන්දියාවයි. ආයෝජන මණ්ඩලයේ සංඛ්‍යා දත්ත වෙත අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජනවලින් 25%ක් පමණ ඉන්දියාවෙන් පැමිණ ඇති බවයි. අප මෙම දත්ත වඩාත් හොඳින් අධ්‍යයනය කළහොත් ගෝලීය වශයෙන් කටයුතු කරන ඉන්දීය සමාගම් බොහෝමයක් සිය ගෝලීය පරිපාලිත ආයතන හරහා ඔවුන්ගේ ආයෝජන යොමු කරන බව අවබෝධ වෙනවා. එබැවින් එම ආයෝජන බොහෝ විට නිල සංඛ්‍යා දත්තවල පෙන්නුම් කරන්නේ තෙවන රටකින් පැමිණි ආයෝජන ලෙසයි. අප එය සැලකිල්ලට ගත් විට, ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජනයන්ගෙන් 40-50%ක් පමණ ඉන්දීය සමාගම්වලින් පැමිණෙන බව පෙනී යනවා. වාර්තාගත කාලයකින් සම්පූර්ණ කරන ලද බටහිර බහාලුම් පර්යන්තය සහ කොළඹ වරාය සඳහා අති නවීන තාක්ෂණය හඳුන්වාදීම සහ CEAT සමාගම විසින් සිදු කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 171ක ආයෝජනය වැනි ව්‍යාපෘතීන් සමඟින් ඉන්දීය ආයෝජන ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කර තිබෙනවා. කලම්බෝ ඩොක්යාඩ් සමාගම මැසගන් ඩොක් ෂිප් බිල්ඩර්ස් සමාගමේ ආයෝජනයක් සමඟින්

බංකොලොත්භාවයේ සිට නැවතත් පුනර්ජීවනය කරා පියනැගීම ද තවත් සුවිශේෂී සිදුවීමක් වන අතර එය දැනටමත් ලොව ප්‍රධාන කොන්ත්‍රාත් හිමි කර ගෙන තිබෙනවා.

අපගේ ආර්ථික සබඳතා ගැඹුරු කිරීම සහ වෙළෙඳ කටයුතු විවිධාංගීකරණය කිරීම සමඟ ඉන්දියාව තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ, සංචාරක සහ ආයෝජන සහකරු වනු ඇති බව මට විශ්වාසයි.

අවසාන වශයෙන් ඉන්දියා-ශ්‍රී ලංකා හවුල්කාරිත්වය අන් කවරදාටත් වඩා සතුටුදායි ස්ථානයක පවතින බව සඳහන් කිරීමට කැමතියි. නව වසරේදී මෙම අසමසම බැඳීම අප දෙරටෙහි ජනතාවට ප්‍රතිලාභ සලසාදීම සඳහා වඩාත් සමීප නියැලීම් සහ තීව්‍ර අවධානයක් සමඟින් තවදුරටත් ගැඹුරු කිරීම අපගේ ප්‍රයත්නයයි.

මාගේ අදහස් දැක්වීමට සාවධානව සවන් දුන් ඔබ සැමට ස්තුතියි. ඔබට ඇති ප්‍රශ්න සඳහා මා දැන් පිළිතුරු දෙන්නම්.

***